**වහාම නිකුත් කිරීම පිණිසය**
විමසීම පිණිස අමතන්න -අරුණි 0777 414415 - aruni@ancedu.com

# ANC උපාධි සහ සම්මාන ප්‍රදානයේදී 15 වසරක විශිෂ්ටත්වය පෙන්නුම් කෙරෙයි

වෙනසට අනුගතව ප්‍රතිඵල අත්විඳින්නැයි ආචාර්ය හර්ෂ ද සිල්වා සිසුන්ගේ ඉල්ලීමක් කරයි
115 කට ඇමරිකානු සහ කැනඩා විශ්වවිද්‍යාලවලට මාරුවීම්
277 දෙනෙක් උපාධි සහ පශ්චාත් උපාධි නිමකරති
හොඳම ප්‍රතිඵල ලබාගත් සහ හොඳම උපාධි නිබන්ධන ඉදිරිපත් සිසුන්ට ශුභාශිංසන

*2017 ජූලි මස 29 දා කොළඹදීය*

නිවැරදි අවස්ථාව සහ නිසි මගපෙන්වීම ලැබෙන්නේ නම් ලෝකයේ හොඳම තරුණ ප්‍රජාවක් ලෙස පලිගැනීමට පාත්‍රවීමේ හැකියාව සහ සක්‍යතාව ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව සතු බව සනාථ කිරීමට මීට වසර පහලොවකට පෙර ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද මෙන්ම මෙරට පුද්ගලික අංශයේ පුරෝගාමී අධ්‍යාපන ආයතනයක් වන ANC Education සමත්ව සිටී.

ANC Education ආයතනය සුවිශේෂී මාරුවීමේ ක්‍රමයක් හඳුන්වා දෙමින් ශ්‍රී ලංකාවේ සිසුන්ට විදේශ විශ්වවිද්‍යාලවලදී අධ්‍යාපනය හැදෑරීමට මංපෙත් විවර කළේය. දැන් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල 100 ක් ට වැඩි සංඛ්‍යාවක් සමග මේ ආයතනය මේ හා සම්බන්ධ කටයුතු කිරීමේ සහයෝගිතාව සකස් කර ගෙන ඇත. එම ආයතනය සිය පරිපාලිත සමාගම් මාර්ගයෙන් පෙර පැසල් අධ්‍යාපනයේ සිට පශ්චාත් උපාධිය දක්වා අධ්‍යාපනය ලැබීමට අවස්ථා මෙරට දරුවන්ට ලබාදී ඇත. එහි උපාධි ප්‍රදානෝත්සවය සහ සම්මාන ප්‍රදානෝත්සවය ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු නියෝජ්‍ය ඇමති ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. එහිදී ඇමරිකන් එක්සත් ජනපදයේ සහ කැනඩාවේ විශ්වවිද්‍යාලවලදී දී අධ්‍යාපනය ලැබීමට මාරුකරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 118 දෙනෙකුට සහ උපාධි , පශ්චාත් උපාධි පාඨමාල නිමකළ සහ ඕස්ට්‍රේලියාවට යාම පිණිස මූලික ඩිප්ලෝමා සහ පාඨමාලා නිමකර ඇති 277 දෙනෙකුට ශුභාශිංසන පිරිනැමිණ.

මෙහිදී අදහස් පළකළ ප්‍රධාන ආරාධිත ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා එතෙක් මෙතෙක් රටේ වඩාත් උගත් තරුණ ප්‍රජාව වත්මන් ශ්‍රී ලංකාවේ සිටින බවත් එම පිරිසෙන් ඵලප්‍රයෝජන ලබාගැනීම ඉතා වැදගත් බවත් කීවේය. තවදුරටත් කතා කළ¨ඔහු රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන සියයට අසූපහකට රජයට තනිව උසස් අධ්‍යාපන අවස්ථා ලබාදිය නොහැකි බව අප දන්නා හෙයින් අපගේ රජය අධ්‍යාපන නිම්වළලු පුළුල් කිරීමට දැඩිලෙස කැපවී සිටී. පෞද්ගලික අංශය ඉදිරිපත්වී මේ සඳහා පැමිණිය යුත්තේ මෙතැනදීය. ANC Education ආයතනය තරුණ ශ්‍රී ලාංකිකයන්ට එම අවස්ථා ලබාදීම සහතික කිරීමට වැදගත් කාර්යභාරයක් ඉටු කරයි¨. ආදර්ශයක් ලෙස දැක්විය හැකි රැකියා දැන් නොමැති බව පැවසූ ඔහු තරුණ ප්‍රජාවගෙන් ඉල්ලා සිටියේ වෙනසට හැඩගැසෙන ලෙසයි. වෙනසේ වගකීම බාරගන්න.. වෙනස්වීම නූතන දිවියේ මූලික අංගයක් වන අතර වෙනසට අනුගතවීම මූලික කුසලතාවකි.

ජාතික සීමාමායිම් ඉක්මවාගිය සමූහ අධ්‍යාපන ආයනය වෙමින් විෂය ක්ෂේත්‍ර රැසක උපාධි අපේක්ෂක, උපාධි සහ පශ්චාත් උපාධි සමූහයක් අඛණ්ඩව පිරිනමන මෙම ආයතනය වෙස්ට්

ලන්ඩන් විශ්ව විද්‍යාලයේ නීති, විද්‍යා සහ ව්‍යාපාර පරිපාලනය ශාස්ත්‍රපති උපාධි (LLM, MSc ,MBA) නිම කළ සහ ඇමරිකාවේ නෝර්ත් වුඩ් සහ මිසෝරි විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලවල උපාධිලාභීන්ට මෙහිදී ශුභාශිංසන පිළිගන්වන ලදී. ජයනි ලක්මිනි ද සිල්වා සහ පිරෝමිනා පුවනේන්ද්‍රන් පිලිවෙලින් වෙස්ට් ලන්ඩන් විශ්වවිද්‍යාලයේ නීති LLM සහ MBA හා MSc උපාධි වැඩසටහන්වල ඉහලම දක්ෂතා පෙන්නුම් කර ඇත. දේශාන එනාක්ෂි ද අල්විස් නෝත්වුඩ් විශ්වවිද්‍යාලයෙන්ද අභිනන්දනයට පාත්‍රවිය.

ANC සභාපති ආචාර්ය ජගත් අල්විස් මහතා ප්‍රකාශ කලේ "ශ්‍රී ලාංකිකයන්ට දැන් ලෝකයේ ප්‍රධාන පෙලේ ඇතැම් විශ්වවිද්‍යාලවට ප්‍රවේශයක් සැලසී ඇති අතර ඉන් පෙන්නුම්කරන්නේ ANC ආයතනය ශ්‍රී ලාංකිකයන්ට අධ්‍යාපනය ලබාගත හැකි උසස් අධ්‍යාපන විෂය පථයන් ව්‍යාප්ත කර ඇති බවයි. ඉන් අදහස්වන්නේ වත්මන් යුගයේ ජාත්‍යන්තර වශයෙන් විවරවී ඇති ඉඩප්‍රස්ථාවන්ගෙන් ශ්‍රී ලාංකිකයන්ට උපරිම ඵලප්‍රයෝජන අත්කර ගත හැකි බවයි. ANC ආයතනයේ අපි එහි විවිධ විෂයයන් උගන්වන පීඨයන් පවත්වා ගෙනයාම ගැන සතුටට පත්වෙමු. අප අපගේ මව් විශ්වවිද්‍යාලයට අදාලවන ඉහලම තත්ව සහතිකවලට අනුකූලව අප අධ්‍යයන කටයුතු සිදුකරන අතර එම ගතිකත්වය අඛණ්ඩව අප සමග එක්ව ඇති විශ්වවිද්‍යාල සහතික කර ඇත."

පසුගිය වසර ANC ආයතනය නව වැඩසටහන් ගණනාවක් හඳුන්වා දුන්නේය. ඕස්ට්‍රේලියානු පදනම් සහ ඍජු ස්ථාපන වැඩසටහන. ඩීකන් විශ්වවිද්‍යාලය සඳහා පදනම් සහ ඩිප්ලෝමා වැඩසටහන, වෙස්ට් ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් සෞඛ්‍ය සහ සායනික මනෝවිද්‍යා සඳහා MSc පාඨමාලාව සහ සත්කාරක සේවා කළමනාකරණය පිළිබඳ MBA වැඩසටහන SUNY ESC වෙතින් මනෝවිද්‍යාව පිළිබඳ BSc සහ EMirates Hospitality Academy වෙතින් උපාධි පාඨමාලාව ඒවාය. "මෙම වැඩසටහන්වලින් පෙන්වන්නේ ANC අඛණ්ඩව මෙම ක්ෂේත්‍රයේ පෙරමුණේ ගමන් කරන බව සහ වෙනස්වන ලෝකයේ ඇති නව අවස්ථා විවර කරදෙන බවයි" විධායක අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි පුනර්ජීව කරුණානායක මහතා කීය. ඔබගේ චින්තනය විශ්ලේෂණය කර ඔබ ANC හිදී ඉගෙනගත්දෙය ඔබගේ සේවාවලදී භාවිත කරන්න. ඉගෙනුම කිසිදිනක නතර නොකරන්න". ANC හි මෙම පුවල් දර්ශනය පෙන්නුම් කරන කදිම සාක්ෂියක්වන්නේ ANC සිසුවකු වන රඛිත මාලේවන, දෙවැනි එලිසබැත් මහ රැජින අතින් ශ්‍රී ලංකාවේ ඉටුකළ ප්‍රජා සේවය වෙනුවෙන් රැජින පිරිනමන තරුණ නායකයා සඳහා වන සම්මානය ලබාගැනීමයි.

ශ්‍රී ලංකාවේ ඇමරිකන් තානාපති කාර්යාලයේ සංස්කෘතික කටයුතු නිලධාරි ජෝශප් පැලර් මහතා පැසුවේ ශ්‍රී ලංකාව සහ ඇමරිකාව අතර දැඩි අධ්‍යාපන සබඳතා ඇති බවයි. "ඇමරිකාවේ අධ්‍යාපනය ලබන දස ලක්ෂයක් වන විදේශ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගෙන් **3000** ක් ශ්‍රී ලාංකිකයෝ වෙති" අධ්‍යාපනයේ වටිනාකම හොඳින් වටහා ගෙන වැඩකිරීම සම්බන්ධයෙන් ඔහු ANC ආයතනයට ප්‍රශංසා කලේය. නෝර්ත්වුඩ් විශ්වවිද්‍යාලයේ සහකාර උපසභාපති සහ ජාත්‍යන්තර වැඩසටහන් අංශයේ පීඨාධිපති ආචාර්ය මම්කෝ රීව්ස් පැවසුවේ ANC ආයතනය සහ නෝර්ත්වුඩ් විශ්වවිද්‍යාලය අතර සහයෝගිතාව මගින් සිසුන්ට අසමසම අත්දැකීම් ලැබෙන බවයි. "ඔබ නව අත්දැකීමක් ලබාගැනීමට සහ ඔබගේ සක්‍යතාවන් මුදා හැර ඉන් ඵලලබාගැනීමේ අවදානම බාරගන්න. ඔබ අතින් සිදුවන වැරදිවලින් පාඩම් ඉගෙන ගෙන ඉලක්කය කරා ගොස් වෙනසක් ඇති කරන්න" වෙස්ට් ලන්ඩන් විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය පීටර් ජෝන් මහතාද එවන් අදහස් පල කරමින් පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපන අංශයෙන් ANC ආයතනය ඉටු කරන ප්‍රමුඛ කාර්යභාරය ඔහුගේ පැසසුමට ලක්කලේය. "ඔබ ලබන උපාධිය ඔබගේ දියුණුව උදෙසා වන සම්පතකි. ඔබගේ උන්නතිය උදෙසා වන සම්පතකි. එය ඔබගේ ප්‍රයෝජනය පිණිස යොදාගන්න උත්සාහ දරනු දැකීමට අපි කැමැත්තෙමු"